**ගිරිබාව ප්‍රාදේශීය සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගිරිබාව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

  - අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

  - භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

  - මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

<table>
<tr><th>විගණන නිරීක්ෂණය</th><th>සභාවේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ) සමාලෝචිත වර්ෂය තුල සභාව සතු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් දරා තිබූ රු.4,139,957 ක මුදල ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධන වත්කමට ආදායමින් දායකවීමේ ගිණුම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.</td><td rowspan="4">විගණනය මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු පිළිගනිමි.</td><td rowspan="4">නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ.</td></tr>
<tr><td>(ආ) සමාලෝචිත වර්ෂයේ වියදම් විෂයයන් 04 ක රු.1,192,494 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.</td></tr>
<tr><td>(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියෝ රු.113,868,803 ක් වුවත් එය රු.111,662,880 ක් ලෙස රු.2,205,923ක් අඩුවෙන් දක්වා තිබුණි.</td></tr>
<tr><td>(ඈ) සභාව සතු ලී බඩු උපකරණ හා යන්ත්‍ර උපකරණ රු.418,736 ක් අනුමැතියකින් තොරව ඉවත් කර තිබුණි. ඒ සඳහා ගිණුම්වලට අවශ්‍ය ගැළපීම් සිදුකර නොතිබුණි.</td></tr>
</table>

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල උපලේඛනය අනුව දැක්වෙන පොදු ණයහිමි වටිනාකම රු.3,097,099 ක් වුවද පොදු ණයහිමි උප ලේඛනය අනුව වටිනාකම රු.177,636ක් වූයෙන් රු.2,919,463 ක වෙනසක් පැවතුණි. | ජ' නල් සටහන් මඟින් මෙම වර්ෂයේ දී අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.1,966,795 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,356,863 ක් විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිලිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිරිබාව බස්නැවතුම්පල කඩ කාමර 04 ක් ඉදිකර තිබූ අතර, මෙම කඩ කාමර වලින් 03 ක් බස් නැවතුම්පොළ ඉදිකිරීමේ දී කඩා ඉවත් කල කඩ කාමර හිමියන්ට ලබා දීමට තීරණය කර තිබුණි. එසේ වුවත් මෙම කඩ කාමර බදු දුන් බවට පැරණි කඩහිමියන් සමඟ ගිවිසුමක් නොතිබුණ අතර, එම කඩ හිමියන්ගේ ඉල්ලීම් ලිපි අනුව අනවසරයෙන් සිටි වෙළෙඳුන් බව නිරීක්ෂණය විය. මෙම කඩ කාමර වසර 03 න් 03 ට ටෙන්ඩර් කිරීමකින් තොරව පැරණි කඩ හිමියන්ට නැවත ලබාදී තිබුණි. දීර්ඝකාලීන බදු ක්‍රමයට ලබාදෙන්නේ නම්, විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය මත එකවර ගෙවීමක් අයකර බදු දිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 03 වන කඩ කාමරය වෙනත් පුද්ගලයෙකුට බදු දී ඇති අතර ඒ සඳහාද විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට අතපසු වී ඇති බව පිලිගනිමි. | පනතේ උපදෙස් ප්‍රකාරව කඩ බදු දීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග වැඩසටහන යටතේ සිංගප්පාලිය ගල්වානේ සිට ආසියාකොටුව මාර්ගය සංවර්ධනය සඳහා රු.2,000,000 ක මුදලකට ගිවිසුම්ගතව වැඩ ආරම්භකර තිබුණි. මාර්ගය 2022 සැප්තැම්බර් 26 දින භෞතික පරීක්ෂාවේ දී මීටර 100 ක් පමණ නිමකර තිබූ අතර, එම නිමි කොටස පරීක්ෂාවේ දී මාර්ගයේ අල්ලා තිබූ කුට්ටිගල් ගිලා බැස තිබූ බවත් කුට්ටිගල් හා ඉදිකිරීම් ද්‍රව්‍ය මාර්ගය දෙපස ගොඩගසා තිබූ බවත් මෙම ඉදිකිරීම සඳහා ගොවි සංවිධානයක් සමඟ රු.2,000,000 ගිවිසුම්ගත වුවද ගිරිබාව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙකු කොන්ත්‍රාත්තුව සිදුකරන බව භෞතික පරීක්ෂාවේදී සනාථ වූ අතර තාක්ෂණ නිලධාරී සහතික කර ඇත. | ද්‍රව්‍ය මිල ගණන් ඇස්තමේන්තු රේට් ගණන් ඉක්මවා ඉහල යාමත්, ද්‍රව්‍ය සපයා ගැනීමේ හිඟයන් නිසා එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමට ගිවිසුම් ගත ආයතනය විසින් කටයුතු කර නොමැත. | * ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති නිමකර ගැනීමට කටයුතු කළ යුතු වේ.<br>* ගිවිසුම්ගත සමිතිය මඟින් ව්‍යාපෘතිය ඉටු කළ යුතු වේ. |
| (ආ) | මෙම ව්‍යාපෘතිය සඳහා අවිධිමත් මිල ගණන් කැඳවීමක් සිදුකර පුහුණු හා නුපුහුණු සේවකයින් 36 දෙනෙක් ප්‍රසම්පාදන අනුමැතියක් මත බඳවාගෙන තිබුණි. වැටුප් ගෙවීමේදී චෙක්රෝල් භාවිතා නොකර පුහුණු හා නුපුහුණු කම්කරුවන්ට රු.2,500 හා 1,900 බැගින් රු.923,200 ක වැටුප් ගෙවීම් කර තිබුණි. | ශ්‍රමය සපයන ආයතන සොයා ගැනීම දුෂ්කර වූ හෙයින්ද නැවත මිල ගණන් කැඳවීමට කාලයක් නොමැති බැවින්ද ලැබූ එක් මිල ගණනක් 2021 දෙසැම්බර් 09 දින පැවැති මුදල් කමිටුවේ දී අනුමත කර ව්‍යාපෘතිය ඉටුකර ඇත. | * ශ්‍රමිකයින්ට ගෙවීම් කිරීමේ දී යොදාගත් අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කළ යුතු වේ.<br>* සේවකයින් යොදවා ගැනීමේ දී මාර්ග සම්මත අනුපාතය (HSR) අනුව ගෙවීම් කළ යුතු වේ. |